සැ. යු.— 2006.04.21 වැනි දින පළකරන ලද අංක 1,442 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,443 - 2006 අප්‍රේල් 28 වැනි සිකුරාදා - 2006.04.28

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 493 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 492 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 494 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 මැයි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 අප්‍රේල් මස 21 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා අධිකරණය – කොළඹ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජ සන්තක කරනු ලැබූ අංක සොයාගත නොහැකි හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ සහ ගර්හිත භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද අංක සොයාගත නොහැකි හා ගර්හිත පහත සඳහන් භාණ්ඩ 2006.05.27 දින පෙ.ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පවත්වන දිනයේ වෙන්දේසිය පැවැත්වීමට පැයකට කලින් හිමිකම් ඉදිරිපත් කළ යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 ට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළ දී ගන්නා භාණ්ඩ සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගන්නා සෑම අයකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර, මිළ දී ගන්නා සියලුම භාණ්ඩ එදින ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය.

කේ. එච්. සුමිත්‍රපාල,
දිසා විනිසුරු - කොළඹ.

2006 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දිසා අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01/59 | 86/90 ඩී | මුද්දක කැඩීගිය කෑබලි 3 ක් ඩයලය නොමැති හම්පටියක් සහිත වටිනාකමක් නොමැති ඔර්ලෝසුවක් |
| 02/120 | 72942/එම් | රත්රන් පැහැති මාල 1 යි. වළලු 1 යි, මුදු 1 යි |
| 03/89 | 22372/ටී | කෝටි බොත්තම් 11යි. |
| | | රත්රන් යැයි කියනු ලබන මුදු 3 යි. |
| | | රත්රන් යැයි කියනු ලබන මුදු 1යි. |
| | | රත්රන් යැයි කියනු ලබන මාල 1 යි. |
| | | රත්රන් මුද්දක් |
| | | රත්රන් යැයි කියනු ලබන මුදු 1 යි. |
| | | කරාබු ජෝඩු 1 යි. |
| | | තවත් කරාබු ජෝඩු යි. |
| 04/102 | ඒ/25 | රත්රන් යැයි කියනු ලබන කරාබු 2 යි. |
| 05/103 | ඒ/24 | මුද්දක් |
| 06/104 | 145/79/ඒ1 | චේන් 1 යි, රත්රන් යැයි කියනු ලබන මුදු 1 යි. |
| | 83/32/ඒ2 | කුඩා සූරයයි. |
| | ඒ/04 | කරාබු ජෝඩුවක් |
| | 4844/ඒ08 | රත්රන් යැයි කියනු ලබන මුද්දක්, සූරයක්, ස්ටඩ් 2 ක් වළලු 2 ක් මාලයක්, කරාබු 2 ක් |
| 07/108 | 2275/ඒල් ජී | ඒ 20 ට්‍රංක පෙට්ටියේ භාණ්ඩ (1) රිදී චේන් දෙකක් සහ චේන් නොමැති යතුරු කැරලි 2 යි. |
| | | (2) රිදී හවඩි 1 යි, |
| | | (3) කැටයම් සහිත රිදී වැනි සිහින් වළලු 55 යි, |
| | | (4) රත්රන් පැහැති පැතලි වළලු 10 යි, |
| | | (5) පැරණි කැටයම් සහිත සළඹ වැනි දෙකක් සහ ඒ හා සමාන තවත් කැබලි 2 |
| | | (6) රිදී පැහැති පැතලි 11 යි. |
| | | (7) දෙකෙලවර විවෘත රවුම් රිදී ලෝහයෙන් තනන ලද වළලු (මොන්ඩියල්) 7 යි. |
| | | (8) රිදී පබලු මාල 11 යි. |
| | | (9) ලෝහ වලින් තනන ලද ස්ප්‍රීන් වැනි කරාබු 34 යි. |
| | | (10) රිදී දම්වැල් හැඩයේ චේන් 3 යි. |
| | | (11) කැඩීගිය කරමාල කොටස් 6 යි |
| | | (12) කැඩීගිය පබලු මාල හතයි. |
| | | (13) රිදී කරමාල 1 යි. |
| | | (14) පැරණි සාක්කු ඔර්ලෝසු 1 යි. |
| | | (15) විවිධ ප්‍රමාණයෙන් සහ හැඩයෙන් යුත් ලෝහමය මුදු 17 යි. |
| | | (16) විවිධ හැඩයෙන් යුත් ලෝහමය කරාබු 15 යි |
| | | (17) දත්කුරු 1 යි. කොණ්ඩ කූරු 04 යි (දෙකක් කැඩී ඇත) |
| | | (18) ගල් සහිත පැන්ඩන් 6 ක් (රන් නොවේ) වෙනත් මාල පෙති දෙකයි. මුදු 01 යි. |
| | | (19) විවිධාකාරයේ ලෝහ කැබලි 6 යි. |
| | | (20) රන් පැහැති රත්රන් නොවන විවිධ ප්‍රමාණයේ කැබලි 55 යි. |
| | | (21) රත්‍රං කිරීමට ගන්නා ලද කුඩා තරාදි 01 යි. |
| | | (22) අඟල් 5 ක් පමණ දිග රත්‍රං යයි අනුමාන කළහැකි කූරු 01 යි. |
| 08/109 | 1898/පී ඕ | ආභරණ තබන කුඩා පැරණි කලුවර පෙට්ටි 1 යි. |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 09/110 | 1593/පීඕ | රිදී සාරිකටු 1 යි, රිදී කරාබු කුට්ටම් 1 යි, රත්රන් පාට සුර 02යි, දිග සුර 02යි, පොඩි සුර 02යි සාක්කු ඔර්ලෝසු 2 යි, කපන ලද මැණික් ගල් 10 යි, නොකපන ලද මැණික් ගල් 31 යි, ලෝහමය කැටයම් කැබලි අඩංගු බෙලෙක් පෙට්ටි 1 යි, ගල් ඔබන ලද මුදු 1 යි, කරාබු ජෝඩු 1 යි, වළල්ලක්. |
| 10/112 | 8738/ටී | (1) රත්රන් යැයි කියනු ලබන ලොකු වළලු ජෝඩු 1 යි.<br>(2) රත්රන් යැයි කියනු ලබන ලොකු වළලු ජෝඩු 1 යි<br>(3) රත්රන් යැයි කියනු ලබන වළලු ජෝඩු 3 යි.<br>(4) පංචායුධයක් සහිත මාලයක්.<br>(5) පංචායුධයක් සහිත මාලයක්.<br>(6) රත්රන් යැයි කියනු ලබන චේන් 1 යි.<br>(7) කෝට් එකට පලඳින චේන් 1 යි.<br>(8) රත්රන් පාට ෂර්ට් බට්න් 5 යි.<br>(9) ප්ලාස්ටික් බොත්තම් ජෝඩු 2 යි.<br>(10) වෙස් මුහුණු සහිත රත්රන් පැහැති කෝට් බට්න් 5 යි.<br>(11) රත්රන් යැයි කියනු ලබන මුදු 3 යි. |
| 11/113 | 6010/ටී | 1. රිදීපාට වළලු 6 යි.<br>2. රිදීපාට කරමාල 1 යි.<br>3. රිදීපාට කොණ්ඩකටු 1 යි.<br>4. රිදීපාට මාල 1 යි.<br>5. රිදීපාට සාරි කටු 1 යි. |
| 12/114 | නැත | 1. තැල්ල 1 යි.<br>2. වලලු කර ආභරණ 1යි. |
| 13/135 | ඒ/23 | 1. කරාබු ජෝඩුවක් සහ මුද්දක් |
| 14/138 | නැත | 1. විවිධ ප්‍රමාණයේ මැණික් ගල් යැයි කියනු ලබන ගල් 30 ක් මුද්‍රා තබා ඇත. |
| 15/139 | නැත | 1. කරාබු ජෝඩු 15 ක්.<br>2. රත්රන් යැයි කියනු ලබන කුඩා මුදු 2 ක්.<br>3. ලෝහමය මුද්දක් (එක මුද්දක ගලක් නොමැත)<br>4. මැණික් ගල් 20 ක්.<br>5. පැති 5 ක තුඩු හැඩයෙන් යුතු ආභරණ 2 ක්. |
| 16/353 | 6/එල්.ජී | මුද්‍රා තබා ඇති පාර්සලයක ඇති රන් අභරණ දෙකක් |
| 17/355 | 6/එල්.ජී | 1. රන් වළලු 2 යි<br>2. පෙන්ඩන් 1 යි.<br>3. ජිප්සි කරාබු ජෝඩුවක් |

**කොළඹ දිසා අධිකරණයේ පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ**

| වර්ගය | පිටු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| ඔර්ලෝසු (බැටරි) | 03 | 02 |
| කබඩ් වානේ ලාච්චු 4 | 04 | 05 |
| කබඩ් වානේ ලාච්චු 3 | 04 | 05 |
| සාමාන්‍ය මේස | 14 | 01 |
| ලිපිකරු මේස | 15 | 08 |
| කම්පියුටර් මේස | 15 | 01 |
| යතුරු ලියන ඉංග්‍රීසි | 16 | 02 |
| යතුරු ලියන සිංහල | 16 | 12 |
| විදුලි පංකා මේස | 19 | 07 |

04-399

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මිරිහාන නුගේගොඩ අංක 115/4හි පදිංචි දැනට බ්‍රිතාන්‍යයේ ලන්ඩන් SW 16 4 UA නෝබරි ඩාසි පාරේ අංක 78හි පදිංචි විතානගේ දොන් අජිත ප්‍රසාද් මහතන්තිල වන මා 1999 අප්‍රේල් මස 21 වන දින අංක 961 දරන ආර්. පී. කේ. රූපසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන ලදී. ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රයෙන් දෝන දයා මාලිනී මහතන්තිල විසින් මා වෙනුවෙන් අත්සන් කරන ලද කිසිම ලියවිල්ලක් අද දින සිට වලංගු නොමැති බව දන්වා සිටිමි.

විතානගේ දොන් අජිත ප්‍රසාද් මහතන්තිල.

04-403/1

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මිරිහාන නුගේගොඩ අංක 115/4, ෂොක්මන් පෙදෙසේ පදංචි දැනට ඇමරිකා එක්සත් ජනපදයේ රෝවේ කැමින්ස්කි ඩ්‍රයිව් අංක 816හි පදිංචි විතානගේ දෝන ගංගා මහේෂ්වරී ජිනදාස වන මා 1999 ජූලි මස 12 වැනි දින අංක 967 දරන ආර්. පී. කේ. රූපසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද නුගේගොඩ මිරිහානේ ෂොක්මන් පෙදෙසේ අංක 115/4, පදිංචි දෝන දයා මාලිනී මහතන්තිල වෙත දෙන ලද ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරමි. ඉහත සඳහන් ඇටර්නි බලපත්‍රයෙන් දෝන දයා මාලිනී මහතන්තිල විසින් මා වෙනුවෙන් අත්සන් කරන ලද කිසිම ලියවිල්ලක් අද දින සිට වලංගු නොමැති බව දන්වා සිටිමි.

විතානගේ දෝන ගංගා මහේෂ්වරී ජිනදාස.

04-403/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සීමාසහිත යුනියන් බැංකුව**
(පාකිස්ථානයේ නීතිගත කරන ලදී)

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි**

අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහනගර සභා සීමාව තුල කොට්ඨාස අංක 5 ලුණුපොකුණ කොටහේන, අල්විස් පෙදෙස, අංක 47 දරන බලයලත් මිනින්දෝරු කේ. කිඩිනපිල්ලේ මහතා විසින් සාදන ලද 1979 අප්‍රේල් 4 වන දින හා අංක 2527 දරන පිඹුරේ ලොට් අංක 01 වශයෙන් නිරූපිත බෙදා වෙන්කළ ඉඩම් කොටස ඉඩම ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්චස් 10.4780 එහි පිහිටි දෙමහල් ගොඩනැගිල්ල, වැව්ලි හා සියළු දේ සමග ව්‍යාපාර නාමය සඳහා වන ආඥා පනත හා 60236 අංක දරන සහතිකය යටතේ ලංකා ප්‍රඩියුස් ඒජන්සීස් යන නමින් කොළඹ 12, ඩෑම් වීදිය අංක 155/1 දරන ස්ථානයේ කොටස්කරු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තම්බු සෙල්වරත්නම් සහ ජයලෙච්චුමී සෙල්වරත්නම් යන අය විසින් දේපල සීමාසහිත යුනියන් බැංකුවේ (පාකිස්ථානයේ නීතිගත කරන ලදී) උකස් කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආරුමුගම් තවනේසන් විසින් සහතික කරන ලද 1995 ඔක්තෝබර් මස 18 දින හා 7339 අංක දරන 1994 අගෝස්තු 3 වන හා 6964 අංක හා 1991 ජනවාරි 30 දින හා අංක 5611 හා 1988 සැප්තැම්බර් 30 දින හා 3927 අංක දරන බැඳුම්කර යටතේ,

තම්බු සෙල්වරත්නම් හා ජයලෙච්චුමී සෙල්වරත්නම් (මෙහි සඳහන් ජයලෙච්චුමී සෙල්වරත්නම් ඇගේ ස්වාමියා වන තම්බු සෙල්වරත්නම් යන අයගේ අවසරය ඇතිව ඒකාබද්ධව කටයුතු කරයි) යන උකස්කරු විසින් ගෙවීම් අතපසුකර ඇත.

සී/ස යුනියන් බැංකුව (පාකිස්ථානයේ නීතිගත කරන ලදී)විසින් අප වෙත පවරන ලද බලතල අනුව 2006 මැයි මස 18 වන බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00ට එකී දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 25%ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 75% මුදල වෙන්දේසි දිනයේ සිට දවස් 30ක් ඇතුලත ගෙවිය යුතුය.
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි)
5. රු. 40,000.00 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500යි
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 යි.

යෝජනා සම්මුතිය සඳහා වන නිවේදනය සඳහා 2006.01.27 දින දරන ඩේලි නිව්ස්, දිනමිණ, තිනකරන් පුවත්පත් ද, 2006.03.03 දින දරන රජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩිදුර විස්තර ලබා ගැනීමටත් හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් කොළඹ 7 ධර්මපාල මාවත, අංක 245 සී/ස යුනියන් බැංකුව (පාකිස්ථානයේ නීතිගත කරන ලදී) ණය පරිපාලක - නිලධාරි වෙතින් සිදුකළ හැකිය.

දුරකථන අංකය : 2679000-5

ෂොක්මන් සහ සමරවික්‍රම
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී, වරලත්
වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

| *ප්‍රධාන කාර්යාලය* | *නගර කාර්යාලය* |
| --- | --- |
| 24, ටොරින්ටන් පාර, මහනුවර | 55ඒ, ධර්මපාල මාවත, කොළඹ 3. |
| දුරකථන 081-2227593 | දුරකථන 011-2441761 |
| දුරකථන/ෆැක්ස් 081-2224371 | දුරකථන/ෆැක්ස් 011-2448526 |
| | ඊ-මේල් samera@sri.lanka.net |

04-377

---

## නිවැරදි කිරීමයි

2006.04.12 වැනි දින අංක 1441 දරන *ගැසට් පත්‍රයේ* වෙන්දේසි කිරීම්වලට අදාල කොටසේ බදුල්ල මහජන බැංකු ශාඛාව විසින් පළකරන ලද වෙන්දේසි දැන්වීමේ 2006.05.25 යනුවෙන් සඳහන්ව ඇති වෙන්දේසි දිනය 2006.05.05 යනුවෙන් නිවැරදි විය යුතුය.

ඩබ්ලිව්. ජයතිලක,
(සාම විනිසුරු),
උසාවි කොමසාරිස්/ප්‍රසිද්ධ වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

04-237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.